රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ :16/2006

මගේ අංකය – 76/1/29/21/MCC/vi
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2006 අගෝස්තු මස 17 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්.

## ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක කිරීම.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1988 ජූනි 07 වන දිනැතිව අංක 509/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1988 මැයි 27 දිනැති ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහය වෙනුවට ආදේශ කරනු ලැබූ 2005 නොවැම්බර් 14 දිනැතිව අංක 1419/3 අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරනු ලැබූ නව ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2005.01.01 දින සිට ක්‍රියාත්මක වේ.

**02. අන්තර්ග්‍රහණය :**

ව්‍යවස්ථා සංග්‍රහයේ 18 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව;

(අ) I. 2005.01.01 දිනට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ සිටින සියළුම නිලධාරීන් නව ව්‍යවස්ථාවේ I ශ්‍රේණියට පුරප්පාඩු සංඛ්‍යාව නොසලකා අන්තර්ග්‍රහණය කරනු ලැබේ.
II. 2005.01.01 දිනට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ සිටින සියළුම නිලධාරීන් නව ප්‍රතිෂ්ඨාපිත II ශ්‍රේණියට ද
III. 2005.01.01 දිනට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ සිටින සියළුම නිලධාරීන් නව ප්‍රතිෂ්ඨාපිත III ශ්‍රේණියට ද අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) ව්‍යවස්ථා සංග්‍රහයේ 20 වගන්තියට අනුකූලව විශ්‍රාම ගැනීමට මනාපය පල කරන නිලධාරීන්ට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 07 වගන්තිය යටතේ විශ්‍රාම යාමට ඉඩ සලසනු ලැබේ. 2010.12.31 දිනට ප්‍රථම මෙම විශ්‍රාම ගැනීමේ මනාපය පල කළ යුතුය. මෙම මනාපය පළ කිරීම නැවත අවලංගු කළ නොහැකි වේ.

**03. පශ්චාත් උපාධි හා පශ්චාත් උපාධි ඩිප්ලෝමා සුදුසුකම් :**

(අ) ව්‍යවස්ථා සංග්‍රහයේ 19(1) අ, 13(3) ආ හා 14 වගන්තිවල සඳහන් පශ්චාත් උපාධි හා පශ්චාත් උපාධි ඩිප්ලෝමා සුදුසුකම් ලබාගැනීම සඳහා වන පාඨමාලාවන් " ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිලිගත් විශ්ව විද්‍යාලයක් / පශ්චාත් උපාධි ආයතනයක් " මගින් හැදෑරිය හැකි වේ.

(ආ) 19(1) ආ වගන්තිය යටතේ සඳහන් වන ලිඛිත නිබන්ධනය ඉදිරිපත්කිරීම සම්බන්ධව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පහසුකම් සපයනු ඇත.

මේ පිළිබඳව අදාල සියළු විස්තර ඉදිරියේ දී නිකුත් කරනු ලබන පුහුණු පාඨමාලා පිළිබඳ චක්‍රලේඛයට ඇතුළත් කරනු ලැබේ.

04. **උසස් කිරීම :**

(අ) 2010.12.31 දින දක්වා වන අන්තර් කාලය තුල එක් එක් පංතියට කරනු ලබන උසස්වීම් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වන වගන්තිය අනුව සිදු කරනු ලැබේ.

I. 2005.12.31 දින දක්වා II වන පංතියේ උසස්කිරීම් පැරණි ව්‍යවස්ථා සංග්‍රහය යටතේ සිදු කරනු ලබන අතර අනතුරුව II වන පංතියට සිදු කරනු ලබන උසස්වීම්වලින් 50% ක් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 අ(1) වගන්තිය අනුවද, 40% ක් 13:2 වගන්තිය අනුව ද 10% ක් 13:3 වගන්තිය අනුව ද සිදු කරනු ලැබේ.

II. I වන පන්තියට උසස්කිරීම ව්‍යවස්ථා සංග්‍රහයේ 17 ආ වගන්තිය අනුව ද

III. විශේෂ ශ්‍රේණියට උසස්කිරීම 17 ඇ වගන්තිය අනුව ද සිදු කරනු ලැබේ.

(ආ) 2010.12.31 දිනට පසු පිළිවෙලින් II වන පංතියට, I වන පංතියට හා විශේෂ ශ්‍රේණියට උසස්කිරීම පිළිවෙලින් සේවා ව්‍යවස්ථාවේ 13, 14 හා 15 වගන්ති අනුව සිදුකරනු ලැබේ. උසස් කිරීම් සඳහා පුරප්පාඩු ගණනය කරනු ලබන දිනය ව්‍යවස්ථා සංග්‍රහයේ 3 (3) වන වගන්තිය අනුව වේ.

05. **පුහුණු අවශ්‍යතා සම්පූර්ණ කිරීම :**

ප්‍රතිසංවිධිත සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන සෑම නිලධාරියෙකුම ව්‍යවස්ථා සංග්‍රහයේ 9 (2) වන වගන්තියේ සඳහන් එම පංතියට නියමිත පුහුණු අවශ්‍යතාවයන් 2010.12.31 දින හෝ ඊළඟ පංතියට උසස්වීම ලැබීමට සුදුසුකම් ලබන දින හෝ යන දින දෙකෙන් පසුව එළඹෙන දිනට පෙර සම්පූර්ණ කළයුතුය.

එසේවුවද 2005.01.01 දිනට අන්තර්ග්‍රහණය කළ පංතිය නොව වෙනත් පංතියකට 2005 වසර තුලම උසස්වූ නිලධාරියෙකු සම්පූර්ණ කළයුත්තේ ඔහු පසුව උසස්වීම ලැබූ පංතියට නියමිත පුහුණු පාඨමාලාවන්ය. අන්තර් කාලය තුල උසස්වීම් ලබන නිලධාරියෙකු සම්පූර්ණ කළ යුතු වන්නේ එලෙස උසස්වූ පන්තියට වන පුහුණු අවශ්‍යතා වේ.

ව්‍යවස්ථා සංග්‍රහයේ 9 (2) යටතේ සඳහන් වන පුහුණු පාඨමාලා පිළිබඳව සම්පූර්ණ විස්තර සහිත චක්‍රලේඛයක් පසුව නිකුත් කරනු ලැබේ.

06. **කාර්යක්ෂමතා කඩඉම් :**

I. පැරණි ව්‍යවස්ථා සංග්‍රහය අනුව කාර්යක්ෂමතා කඩඉම් විභාග 2006 වසරෙහි දී පමණක් පැවැත්වේ. ඒ අනුව කිසියම් නිලධාරියෙකුට පැරණි ව්‍යවස්ථා සංග්‍රහය අනුව පළමු කාර්යක්ෂමතා කඩඉමෙහි සම්පූර්ණ කළයුතු විෂයයක් වන රාජ්‍ය මූල්‍ය ක්‍රම විෂයය දෙවන කාර්යක්ෂමතා කඩඉමෙහි රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණ විෂයය සමත්වීමෙන් සම්පූර්ණ කිරීමට ඉඩ සලසනු ලබන අතර එසේ එම විෂයය සමත්වූ දිනය පළමු කාර්යක්ෂමතා කඩඉම සමත්වූ දිනය ලෙස සළකනු ලැබේ.

II. දැනට සිදු කරනු ලබන පරිදි ඇතැම් කාර්යක්ෂමතා කඩඉම් විෂයයන් නිදහස් කරනු ලැබීම තවදුරටත් ක්‍රියාත්මක නොවන අතර 2005.12.31 දක්වා බඳවාගත් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් කණ්ඩායම් වලට පමණක් එම නිදහස් කිරීම තවදුරටත් ක්‍රියාත්මක වේ.

III. පැරණි සේවා ව්‍යවස්ථාව යටතේ කුසලතා පදනම මත බඳවා ගනු ලැබූ හා බඳවා ගැනීමට අපේක්ෂිත කණ්ඩායම් පමණක් පළමු කාර්යක්ෂමතා කඩඉම සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරන අතර ඔවුන් දෙවන කාර්යක්ෂමතා කඩඉම හා දෙවන භාෂා පරීක්ෂණය සමත් විය යුතු අතර දෙවන භාෂා පරීක්ෂණයෙන් නිදහස්වීම සඳහා ඉහත අනුග්‍රහය ලබාදෙනු ලැබේ.

ඩී. දිසානායක
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.